## ග්‍රාමීය වැඩිහිටි සමිති සවිබල ගැන්වීමේ වැඩසටහන - 2026

## හැඳින්වීම

දිවයින පුරා පිහිටුවා පවත්වාගෙන යනු ලබන ග්‍රාමීය වැඩිහිටි සමිති මඟින් වැඩිහිටි ප්‍රජාව වෙත හුදෙකලා බව අවම කරමින්, සක්‍රීය හා ඵලදායී දිවි පෙවෙතක් ගත කිරීමට අවස්ථාව සැලසෙනු ඇත. මෙම වැඩිහිටි සමිතිවල ක්‍රියාකාරිත්වය වැඩි දියුණු කරමින් සාර්ථකව පවත්වාගෙන යාමට අත්වැලක් සැපයීමේ අරමුණින් යුතුව, වැඩිහිටි සමිති සඳහා භෞතික උපකරණ ලබා දීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.

## අරමුණු

- ග්‍රාමීය වැඩිහිටි සමිති ශක්තිමත් කර වැඩිහිටි සහභාගීත්වය ඉහළ නැංවීම.
- වැඩිහිටි ප්‍රජාව වෙත සක්‍රීය හා ඵලදායී දිවි පෙවෙතක් අත්කර දෙමින්, ඔවුන් වෙත විවිධ වැඩසටහන් හරහා සුබසාධනය සැලසීම.
- සක්‍රීය හා ඵලදායී දිවි පෙවෙතක් හරහා සෞඛ්‍ය සම්පන්න හා අධ්‍යාත්මික සුවයෙන් පිරි වැඩිහිටි පරපුරක් බිහි කිරීම.

## ක්‍රියාත්මක ක්‍රමවේදය

- ග්‍රාමීය වැඩිහිටි සමිති මඟින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත අයදුම් පත් ලබාගත යුතුයි.
- ලැබෙන අයදුම්පත් අතුරින් සුදුසු ග්‍රාමීය වැඩිහිටි සමිති 02 ක් තෝරා ගත යුතුය.
- ආධාර ලබාදෙන ග්‍රාමීය වැඩිහිටි සමිතිය, ලියාපදිංචි ග්‍රාමීය වැඩිහිටි සමිතියක් විය යුතුය. (අවම වශයෙන් වසරකට පෙර ලියාපදිංචි වී තිබිය යුතුය.)
- භෞතික උපකරණ ලබා ගැනීම සම්බන්ධව අදාළ ග්‍රාමීය වැඩිහිටි සමිතියේ මහා සභා රැස්වීමක යෝජනා ස්ථිර කර තිබිය යුතුය.
- ග්‍රාමීය වැඩිහිටි සමිතිය පසුගිය වසර 05 තුළ ක්‍රියාකාරී වැඩිහිටි සමිතියක් විය යුතුය.
- ග්‍රාමීය වැඩිහිටි සමිති තෝරා ගැනීමේදී දුෂ්කර ග්‍රාම නිලධාරි වසම් සඳහා ප්‍රමුඛතාව ලබා දීමට කටයුතු කළ යුතුය.
- ලබා ගැනීමට අපේක්ෂිත භාණ්ඩ සඳහා ප්‍රාදේශිය ලේකම් විසින් නිර්දේශ කරන ලද ඇස්තමේන්තුවක් ඉදිරිපත් කළ යුතුය.
- එක් එක් සමිතිය සඳහා අවශ්‍යතාවය සහිතව වෙන් වෙන් වශයෙන් ඇස්තමේන්තු සකස් කළ යුතුය.
- අනුමත කරන ලද ඇස්තමේන්තුවට අදාළ භාණ්ඩ වෙනස් වන්නේ නම්, එම වෙනස් වන භාණ්ඩ පිළිබඳව ප්‍රධාන කාර්යාලය දැනුවත් කළ යුතුය.
- භාණ්ඩ වර්ග ලබා දීමේදී ග්‍රාමීය වැඩිහිටි සමිති සවිබලගැන්විය හැකි ප්‍රාග්ධන ස්වරූපයෙන් භාණ්ඩ ලබා දිය යුතුය. පරිභෝජන ස්වරූපයේ (ලිපිද්‍රව්‍ය වැනි) හා පරිපාලන වියදම් සඳහා එම මුදල් යොදා නොගත යුතුය.
- එකම භාණ්ඩ වර්ගය සඳහා, එකම මිල ගණන් ඉදිරිපත් කළ යුතුය. (එකම භාණ්ඩය සඳහා මිල ගණන් වෙනස් වන්නේ නම්, ඒ සඳහා හේතු පැහැදිලිව සඳහන් කර එවිය යුතුය.)
- නිසි පරිදි සම්පූර්ණ කරන ලද පිරික්සුම් ලයිස්තුව ප්‍රාදේශිය ලේකම් විසින් අනුමත කළ යුතුය. (ඇමුණුම 02)
- එක් එක් ග්‍රාමීය වැඩිහිටි සමිති සඳහා වෙන් වෙන් වශයෙන් පිරික්සුම් ලයිස්තු ඉදිරිපත් කළ යුතුය.
- ලබා දෙන ලද භාණ්ඩ සුරක්ෂිතව තබා ගැනීම සඳහා ස්ථානයක් හඳුනාගෙන තිබිය යුතුය.
- මිලදී ගත් භාණ්ඩ ඉන්වෙන්ට්‍රියට ඇතුළත් කර, විෂය නිලධාරි විසින් වාර්තා කළ යුතුය.

**<u>අධීක්ෂණය හා පසු විපරම් කිරීම</u>**

- ආධාර මුදල් ලැබීමෙන් පසු පොදු 72 ආකෘතිය මගින් මුදල් ලද බව වාර්ථා කළ යුතුය.
- ලබා දුන් මුදලට අදාළ වියදම් වාර්තා, වැඩිහිටි සමිති වෙත භාණ්ඩ ලබාදුන් වහාම භාණ්ඩ ලබාදීම සම්බන්ධව වියදම් වාර්තාව යොමුකළ යුතුය.
- සමිති වෙත ලබා දුන් භාණ්ඩ පිළිබඳව විෂය නිලධාරී විසින් ත්‍රෛයිමාසිකව පසු විපරමක් සිදුකර ඒ පිළිබඳ වාර්තා කාර්යාල ගොනුවේ තබාගත යුතුය.

**<u>වැඩිහිටි සමිති විසින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ඉදිරිපත් කළ යුතු ලේඛන</u>**

1. ග්‍රාමීය වැඩිහිටි සමිතියේ ලියාපදිංචි සහතිකය.
2. ග්‍රාමීය වැඩිහිටි සමිති යාවත්කාලින කරන ලද ගිණුමේ ඡායා පිටපතක්.
3. ග්‍රාමීය වැඩිහිටි සමිතියේ සමාජික නාම ලේඛණය.
4. ග්‍රාමීය වැඩිහිටි සමිතිය සතු වත්කම් ලේඛණය.
5. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන නිලධාරි/ සංවර්ධන නිලධාරි (වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන) විසින් ඉදිරිපත් කරන ලද, අදාළ ඉල්ලීම පිළිබඳ නිර්දේශ සහිත ක්ෂේත්‍ර වාර්තාව
6. භෞතික උපකරණ ලබා ගැනිම සම්බන්ධව අදාළ ග්‍රාමීය වැඩිහිටි සමිතියේ මහා සභා රැස්වීමක යෝජනා ස්ථිර කරන ලද වාර්තාව
7. ඉල්ලුම් කරන ලද අවශ්‍ය භාණ්ඩ ලේඛනය

**<u>ඉල්ලීමට අදාළව, ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කළ යුතු ලේඛන</u>**

1. ඇස්තමේන්තුව සහිත ආදර්ශ අයදුම් පත්‍රය (ඇමුණුම - 01)
2. පිරික්සුම් ලැයිස්තුව (ඇමුණුම - 02)
3. ග්‍රාමීය වැඩිහිටි සමිතියේ ඉල්ලීම් ලිපිය
4. ග්‍රාමීය වැඩිහිටි සමිතියේ වත්කම් ලේඛනය (භෞතික උපකරණ ලේඛනය)

**<u>ප්‍රතිලාභීන් තෝරා ගැනීම</u>**

- ඉහත සඳහන් නිර්ණායක යටතේ ප්‍රාදේශීය ලේකම් හෝ ඔහුගේ නියෝජිතයෙකු වන මාණ්ඩලික නිලධාරියෙකු හා පරිපාලන ග්‍රාම නිලධාරි, වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන නිලධාරි, සංවර්ධන නිලධාරි (වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන) යන අයගෙන් දෙදෙනෙකු සමඟ තිදෙනෙකුගෙන් (3) යුත්ත කමිටුවක් මගින් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකට වඩාත් සුදුසු ග්‍රාමීය වැඩිහිටි කමිටු 02 ප්‍රමුඛතාවයේ අනුපිළිවෙලට තෝරා, ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය සහිතව **<u>2026. 06.30</u>** දිනට පෙර, යොමු කළ යුතුය. (2021 - 2025 වසර තුළ ඉල්ලුම් කරන ලද ග්‍රාමීය වැඩිහිටි සමිති සඳහා මෙම වසරේ ඉල්ලුම් කළ නොහැක.)

- එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් වෙත, එක් සමිතියක් වෙනුවෙන් රු.100,000/- ක උපරිමයකට යටත්ව, වැඩිහිටි සමිති 02 ක් සඳහා මුදල් ලබාදෙනු ලැබේ. එසේ වුව ද, 2026, ජුනි මස 30 දිනට ලැබෙන ඉල්ලීම් අනුව ආධාර ලබාදීමෙන් අනතුරුව, මෙම වැඩසටහන යටතේ ඉල්ලීම් ඉදිරිපත් නොකරනු ලබන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වෙනුවෙන් වෙන් කරන ලද මුදල්, තව දුරටත් ආධාර අවශ්‍ය, (නියමිත සමිති 02 ට අමතරව) ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ලබා දීමට කටයුතු කරනු ලබේ. එබැවින් ඔබගේ ඉල්ලීම් 2026, ජුනි මස 30 දින වනවිට ලබා දීමට කටයුතු කළ යුතුය.

<u>ලබා දීමට නියමිත උපකරණ</u>

1. වැඩිහිටි සංවිධානයේ කටයුතු හා රැස්වීම් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය මේස, පුටු වැනි කාර්යාලීය උපකරණ.
2. ප්‍රථමාධාර අවශ්‍යතා සඳහා වන ඇඳක් වැනි උපකරණ.
3. ආහාර පිළියෙල කර ගැනීම ඇතුළු මුළුතැන්ගෙය සඳහා අවශ්‍ය උපකරණ.
4. වෙනත් අත්‍යවශ්‍ය උපකරණ. (මෙම උපකරණ වල අවශ්‍යතාවය පැහැදිලි කර කමිටුව මඟින් නිර්දේශ කළ යුතුය.)

මෙම උපකරණ නිසි පරිදි ආරක්ෂිතව ගබඩා කර තැබීමේ හැකියාව කමිටුව මඟින් සනාථ කළ යුතු අතර, තෝරා ගන්නා වැඩිහිටි සමිතියට අදාළ ලිපි ලේඛන **(ආදර්ශ අයදුම් පත්‍රය , පිරික්සුම් ලැයිස්තුව, ග්‍රාමීය වැඩිහිටි සමිතියේ ඉල්ලීම් ලිපිය, ග්‍රාමීය වැඩිහිටි සමිතියේ වත්කම් ලේඛණය (භෞතික උපකරණ ලේඛණය)** සමඟ යොමු කළ යුතුය.